# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,393 - 2024 ජූලි මස 12 වැනි සිකුරාදා - 2024.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1930 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1939 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1942 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 අගෝස්තු මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට්* පත්‍රයේ දැන්වීම් 2024 ජූලි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට්* පත්‍රය *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - බලපිටිය**

මෙම අධිකරණයේ අවසන් කරන ලද නඩු වලට අදාළ අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති රාජසන්තක කරන ලද, හිමිකම් නොපාන වාහන හා නඩු භාණ්ඩ ද, භාණ්ඩ සමීක්ෂණය අනුව ඉවත් කරන ලද උපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

01. පහත උපලේඛනයේ සඳහන් බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු අවසන් වී ඇති රාජසන්තක කරන ලද, මෙතෙක් හිමිකම් නොපාන ලද වාහන හා නඩු භාණ්ඩ **2024.07.27** වැනි දින පෙ.ව. **10.30** ට බලපිටිය අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් වාහනයක් හෝ භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාළ වාහන හා භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියට නියමිත වාහන හා භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම වාහන හා භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසි භූමියට පැමිණෙන සෑම දෙනාම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

06. සියලු ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර මිල දී ගන්නා වාහන හා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ දී **පස්වරු 4.00 ට පෙර** අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතුය.

ආර්. ඩී. ජානක,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු.

2024 ජුනි මස 27 වැනි දින,
බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *පීආර් අංකය* | *භාණ්ඩය* |
|---|---|---|---|
| 01 | AR 2836/23 | 27/18 | පාපැදි 01 |
| 02 | AR 2834/23 | 335/18 | පාපැදි 01 |
| 03 | AR 2833/23 | 234/20 | පාපැදි 01 |
| 04 | AR 2835/23 | 92/13 | පාපැදි 01 |
| 05 | AR 2837/23 | 408/13 | පාපැදි 01 |
| 06 | 26116/19 | 1694/19 | සී. සී. ටී. වී. කැමරා |

| *අනු. අංකය* | *නඩු අංකය* | *පීආර් අංකය* | *භාණ්ඩය* |
|---|---|---|---|
| 07 | 59276 | 662/23 | ජංගම දුරකථන |
| 08 | 65270 | 247/24 | ගෑස්ලිප් |
| 09 | 65270 | 247/24 | ගෑස් සිලින්ඩරය<br>කිලෝ 12.5 |
| 10 | 66861 | 780/24 | බෙඩ්ෂීට් |
| 11 | 66929 | 335/24 | ලොකු තුවා |
| 12 | 61771/23 | 877/23 | සුදු යකඩ බාර් |
| 13 | 64197/23 | 54/24 | සුදු යකඩ බාර් |
| 14 | 67751 | 580/24 | පැදුරු |
| 15 | 67584 | 344/24 | යකඩ බැරල් 01 |
| 16 | 66455 | 343/24 | යකඩ බැරල් 06 |
| 17 | අංක රහිත | | ලීටර් 20 ප්‍රමාණයේ කෑන් |
| 18 | අංක රහිත | | ලීටර් 05 ප්‍රමාණයේ කෑන් |
| 19 | අංක රහිත | | වීදුරු බෝතල් |
| 20 | 64700 | 157/24 | පස් කියුබ් 01 |
| 21 | 59431 | 685/23 | පස් කියුබ් 01 |
| 22 | 63079 | 1082/23 | පස් කියුබ් 01 |
| 23 | 64840 | 172/24 | පස් කියුබ් 01 |
| 24 | 47792 | 399/22 | පස් කියුබ් 01 |
| 25 | 58002 | 532/23 | වැලි කියුබ් 01 |
| 26 | 63659 | 60/24 | වැලි කියුබ් 01 |
| 27 | 63635 | 8/24 | වැලි කියුබ් 01 |
| 28 | 53496 | 98/23 | වැලි කියුබ් 01 |
| 29 | AR 967/23 | WPMY - 7249 | පල්සර් වර්ගයේ යතුරු පැදිය (අබලි) |
| 30 | AR 2838/23 | WPGV - 3826 | CD 90 වර්ගයේ යතුරු පැදිය (අබලි) |

| *අනු. අංකය* | *නඩු අංකය* | *පීආර් අංකය* | *භාණ්ඩය* |
|---|---|---|---|
| 31 | 45548 | 340-4119 | අත් ට්‍රැක්ටරය (ටේලරය නොමැති) (අබලි) |
| 32 | AR 2839/23 | 158-2316 | හීරෝ හොන්ඩා වර්ගයේ යතුරු පැදිය (අබලි) |
| 33 | AR 2840/23 | SPTH - 4364 | රතු පැහැති යතුරු පැදිය (අබලි) |
| 34 | 89761 | SPJS - 3449 | CT 100 වර්ගයේ යතුරු පැදි කොටස් (අබලි) |
| 35 | භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද උපකරණ | | කේතල (ඉලෙක්ට්‍රික්) |
| 36 | | | ගෑස් කුකර් |
| 37 | | | වායු සමීකරණ යන්ත්‍රය |
| 38 | | | ඉලෙක්ට්‍රික් ජොග්ගු |
| 39 | | | පුටු (යතුරු ලියන) |
| 40 | | | බන්දේසි (ලිපි ගොනු) |
| 41 | | | වොයිස් රෙකෝඩර් |
| 42 | | | ස්කෑන් යන්ත්‍ර |
| 43 | | | හඬ පටිගත කිරීමේ යන්ත්‍ර |
| 44 | | | සිවිලිං විදුලි පංකා |

07 - 367

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වරකාපොල**

2024.06.28 වැනි දින *ගැසට්* පත්‍රයේ පළ කරන ලද 06 - 206 නිවේදනයට අනුව 2024.07.13 දින පැවැත්වීමට නියමිතව තිබූ භාණ්ඩ වෙන්දේසිය අවලංගු කරන අතර, එය **2024.07.27** දින පැවැත්වීමට කටයුතු යොදා ඇත.

එසේ ම එදින *ගැසට්* පත්‍රයේ පළ කරන ලද කොන්දේසි එලෙස ම නොවෙනස්ව පවතින බවත්, වෙන්දේසි කරනු ලබන භාණ්ඩ ලේඛනය ද එලෙස ම පවතින බවත් දන්වනු ලැබේ.

ලූෂාකා කුමාරි ධර්මකීර්ති,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වරකාපොල.

2024 ජූලි මස 04 වැනි දින,
වරකාපොල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

07 - 430

2024.06.28 *ගැසට්* පත්‍රයේ පළවූ 06 -206 නිවේදනය යළි පළ කිරීමකි.

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වරකාපොල**

* මෙම අධිකරණයේ පැවති නඩුවලට අදාළ රාජසන්තක කරන ලද අයිතිවාසිකම් නොකියන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ **2024.07.27 දින පෙ.ව. 10.00** ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

* උපලේඛනයේ සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන යම් තැනැත්තෙක් සිටී නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින **පෙ.ව. 9.30** ට පෙර ස්වකීය හිමිකම් තහවුරු කළ යුතුය.

* රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද සෞඛ්‍ය විධිවිධානවලට අනුකූලව වෙන්දේසිය සඳහා සහභාගී විය යුතුය.

* වෙන්දේසිය පැවැත්වෙන දින **පෙ.ව. 8.30 සිට 9.30** දක්වා කාලය තුළ මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබාගෙන භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

* අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

* වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගන්නා තැනැත්තන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

* වෙන්දේසියේ දී මිල දී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදලින් පමණක් ගෙවීම් කළ යුතුය. චෙක්පත්, මුදල් ඇණවුම් හා බැංකු අණකර භාරගනු නොලැබේ.

* වෙන්දේසිය පිළිබඳ කරනු ලබන පැමිණිලි චෝදනා වෙන්දේසිය අවසන් වූ වහාම ඉදිරිපත් කළ යුතු අතර පසුව කරනු ලබන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

* වෙන්දේසියේ මිල දී ගන්නා භාණ්ඩ එදින **ප.ව. 3.30** ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

ලූෂාකා කුමාරි ධර්මකීර්ති,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වරකාපොල.

2024 ජුලි මස 02 වැනි දින,
වරකාපොල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වරකාපොල
ප්‍රසිද්ධ වෙන්දේසිය - 2024 (II)

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01 | 95612 | 43 - 7361 ටිපර් රථය |
| 02 | B 495/13 | විල්බැරෝ 01<br>උදලු 01 |
| 03 | 15062 | ගෑස් ලිප සහ රෙගියුලේටරය |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 04 | B 336/22<br>(8361) | හැමර් යන්ත්‍ර 01<br>හැමර් කටු 01<br>ගල් කටු 02<br>අලවංගු 01<br>යකඩ පොලු 02<br>පැතලි ගල් කටු 01<br>බෝල මිටි 01<br>කුලු ගෙඩි 01<br>දුඹුරු පාට බකට් 01 |
| 05 | 1814 | ඇලුමිනියම් මුට්ටි 02 |
| 06 | 14074 | ඇලුමිනියම් මුට්ටි 01<br>ඇලුමිනියම් කොරොස් 01 |
| 07 | 14164 | යකඩ බැරල් 01 |
| 08 | 11854 | යකඩ බැරල් 01 |
| 09 | B 443/21<br>(6513) | 12.5 kg ගෑස් සිලින්ඩර් 01<br>රෙගියුලේටරය සහිත ලිප් 01<br>යකඩ බැරල් 01 |
| 10 | 87995 | 12.5 kg ගෑස් සිලින්ඩර් 01<br>ඇලුමිනියම් මුට්ටි 01 |
| 11 | 9348 | යකඩ බැරල් 01 |
| 12 | B 314/18<br>(95130) | 12.5 kg ගෑස් සිලින්ඩර් 01<br>රෙගියුලේටරය සහිත ලිප් 01 |
| 13 | 13817 | 12.5 kg ගෑස් සිලින්ඩර් 01<br>රෙගියුලේටරේ සහිත ලිප් 01<br>බේසන් 01<br>ඇලුමිනියම් මුට්ටි 02 |
| 14 | 97886 | සවල් 02 |
| 15 | 5935 | ඇලුමිනියම් මුට්ටි 01<br>මැටි මුට්ටි 01 |
| 16 | 92347 | රෙගියුලේටරේ සහිත ලිප් 01<br>යකඩ බැරල් 01 |
| 17 | 5787 | ප්ලාස්ටික් බැරල් 01 |
| 18 | 6641 | රතු පාට බාස්කට් 01 |

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 19 | A 354/24 | බාල්දි 02<br>සවල් 02 |
| 20 | 7829 | යකඩ බැරල් 01 |
| 21 | 7397 | යකඩ බැරල් 01 |
| 22 | 5388 | යකඩ බැරල් 01 |
| 23 | 4866 | යකඩ බැරල් 01 |
| 24 | 81772 | 12.5 kg ගෑස් සිලින්ඩර් 01 |
| 25 | 12728 | යකඩ බැරල් 01 |
| 26 | B 30/18<br>(99348) | පා පැදි 01 |
| 27 | B 304/22<br>(8666) | පලංචි මුක්කු 04 |
| 28 | 61383 | යකඩ බැරල් 03 |
| 29 | B 535/21<br>(6597) | යකඩ බැරල් 05 |
| 30 | | බෝතල් තොගයක් |
| 31 | | බූලි තොගයක් |

07 - 431

---

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - කිලිනොච්චිය

කිලිනොච්චිය මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද යතුරු පැදි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. කිලිනොච්චිය මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද හා මේ වනතුරු හිමිකම් නොකී යතුරුපැදි සහ භාණ්ඩ **2024.07.27** වැනි දින පෙ.ව. **9.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. වෙන්දේසියේ විකිණීමට නියමිත වාහන සහ භාණ්ඩ සම්බන්ධයෙන් හිමිකම් කියන්නන් සිටින්නේ නම් වෙන්දේසිය ආරම්භ වීමට පැය භාගයකට පෙර තම ඉල්ලීම ඉදිරිපත් කළ යුතුයි.

03. වෙන්දේසියේ විකිණීමට නියමිත යතුරු පැදි හා භාණ්ඩ වෙන්දේසිය ආරම්භ වීමට පැය භාගයකට පෙර මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත නිරීක්ෂණය කළ හැකිය.

04. වෙන්දේසියේ විකිණීමට නියමිත යතුරු පැදි හා භාණ්ඩවලට නියමිත ඉල්ලීම නොලැබූ අවස්ථාවේ දී එම යතුරු පැදි හා භාණ්ඩ වෙන්දේසියෙන් ආපසු ලබාගැනීමේ හිමිකම අධිකරණය සතු වේ.

05. වෙන්දේසියේ විකුණනු ලැබූ යතුරු පැදි හා භාණ්ඩවලට මුදල් එම අවස්ථාවේ දී ම ගෙවා යතුරු පැදි හා භාණ්ඩ අධිකරණ භූමියෙන් වහාම ඉවත් කර ගත යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසි භූමියට පැමිණෙන්නන් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා වලංගු ලේඛණ සමග පැමිණිය යුතුය.

ගයාත්‍රි ශයිලවන්,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්.

2024 ජූලි මස 01 වැනි දින,
කිලිනොච්චිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අංකය* | *නඩු අංකය* | | | *වාහන අංකය* | *වාහන වර්ගය* | *වාහනයේ තත්ත්වය* |
|---|---|---|---|---|---|---|
| | *නඩු අංකය* | *බී වාර්තාව* | *ඒ වාර්තාව* | | | |
| 01 | | | 337/23 | BIK 1825 | බජාජ් පල්සර 50 | කොටස් ලෙස |
| 02 | | | 339/23 | HW 8258 | ලීෆන් | කොටස් ලෙස |
| 03 | | | 153/23 | WA 9540 | හීරෝ හොන්ඩා ප්ලේෂර් | ලියාපදිංචි කළ හැක |
| 04 | | | 553/18 | BFP 4202 | බජාජ් ප්ලැටිනා | ලියාපදිංචි කළ හැක |
| 05 | | | 290/21 | TH 0701 | හොන් සුපර් කප් | කොටස් ලෙස |
| 06 | | | 1558/21 | GP 4280 | බජාජ් බොක්සර් | කොටස් ලෙස |
| 07 | 21061 | | | JY 8671 | TVS වික්ටර් | කොටස් ලෙස |
| 08 | | | 1095/18 | JT 2500 | හීරෝ හොන්ඩා CD ඩවුන් | කොටස් ලෙස |
| 09 | 37072 | | | 149 - 3870 | හොන්ඩා MD 90 | කොටස් ලෙස |
| 10 | 30410 | 311/18 | | MF 5761 | හීරෝ හොන්ඩා පැසන් ප්ලස් | කොටස් ලෙස |
| 11 | | 469/17 | | BDE 2826 | හීරෝ ඩවුන් | කොටස් ලෙස |
| 12 | 29819 | 136/18 | | HL 8903 | TVS හීරෝ | කොටස් ලෙස |

| අංකය | නඩු අංකය | | | වාහන අංකය | වාහන වර්ගය | වාහනයේ තත්ත්වය |
|---|---|---|---|---|---|---|
| | නඩු අංකය | බී වාර්තාව | ඒ වාර්තාව | | | |
| 13 | 31884 | 171/17 | | WP 8305 | ඩියාඩෝ | කොටස් ලෙස |
| 14 | 20489 | | | XF 5580 | හීරෝ හොන්ඩා CD ඩවුන් | කොටස් ලෙස |
| 15 | 26232 | | | BDK 9266 | බජාජ් පල්සර් 50 | කොටස් ලෙස |
| 16 | 12482 | 461/14 | | HT 2617 | හීරෝ හොන්ඩා පැසන් ප්ලස් | කොටස් ලෙස |
| 17 | | | 1557/21 | TA 1388 | TVS GLX | කොටස් ලෙස |
| 18 | | | 553/18 | XB 8465 | බජාජ් ඩිස්කවරි 150 | කොටස් ලෙස |
| 19 | 27724 | | | GV 2707 | යමහා YBX | කොටස් ලෙස |
| 20 | 30761 | | | BGN 1375 | හීරෝ HDF ඩියුක්ස් | ලියාපදිංචි කළ හැක |
| 21 | 21465 | | | GZ 2413 | හීරෝ හොන්ඩා ග්ලැමර් | කොටස් ලෙස |
| 22 | 20648 | | | BCE 1881 | හීරෝ ඩවුන් | කොටස් ලෙස |
| 23 | 27176 | | | 144 5420 | හීරෝ හොන්ඩා CD 100 | කොටස් ලෙස |
| 24 | 22184 | | | GW 4880 | හීරෝ ඩවුන් | කොටස් ලෙස |
| 25 | | | 1095/18 | GN 7833 | හීරෝ හොන්ඩා ස්ප්ලෙන්ඩර් | කොටස් ලෙස |
| 26 | | | 271/21 | JK 7336 | බජාජ් පල්සර් BYK | කොටස් ලෙස |
| 27 | | | 272/21 | VL 7409 | බජාජ් පල්සර් 150 | ලියාපදිංචි කළ හැක |
| 28 | | | 274/21 | WV 6877 | බජාජ් ඩිස්කවරි 150 | ලියාපදිංචි කළ හැක |
| 29 | | | 276/21 | JK 0673 | හීරෝ හොන්ඩා පැසන් ප්ලස් | ලියාපදිංචි කළ හැක |
| 30 | | | 279/21 | WT 5699 | බජාජ් ඩිස්කවරි DTS SI | ලියාපදිංචි කළ හැක |
| 31 | | | 1398/20 | UA 1259 | බජාජ් CT 100 | ලියාපදිංචි කළ හැක |
| 32 | | | 1678/20 | MF 3480 | හීරෝ හොන්ඩා CD ඩවුන් | කොටස් ලෙස |
| 33 | | | 243/20 | VY 2903 | හීරෝ හොන්ඩා පැසන් PRO | ලියාපදිංචි කළ හැක |
| 34 | | | 1096/19 | HZ 9385 | TVS වික්ටර් GL | ලියාපදිංචි කළ හැක |
| 35 | | | | WW 2247 | බජාජ් පල්සර් 135 LS | ලියාපදිංචි කළ හැක |

| අංකය | නඩු අංකය | | | වාහන අංකය | වාහන වර්ගය | වාහනයේ තත්ත්වය |
|---|---|---|---|---|---|---|
| | නඩු අංකය | බී වාර්තාව | ඒ වාර්තාව | | | |
| 36 | 27650 | | | N/A | TVS හෙවිඩියුටි | කොටස් ලෙස |
| 37 | 31662 | | | PR 5715 | ටාටා 207 DI | ලියාපදිංචි කළ හැක |
| 38 | | | 1625/22 | S.N 403260180 | වතුර පොම්පය | |
| 39 | | | 1625/22 | S.N HM 158-16-3811 | වතුර පොම්පය | |
| 40 | | | 1625/22 | S.N 210354 | වතුර පොම්පය | |
| 41 | | | 1625/22 | S.N GOM 6901643 FMX | වතුර පොම්පය | |
| 42 | | | 1625/22 | S.N GOM 6940576 IMX | | |
| 43 | | | 1626/22 | S.N E 32 DM 110020030 28700502 | රූපවාහිනි යන්ත්‍රය | |
| 44 | | | 1626/22 | S.N HTRU 91 HC 603486 E | ලැප්ටොප් පරිගනකය | |
| 45 | | | 1626/22 | ඉමී අංක 356748971504380 | ස්මාර්ට් ජංගම දුරකතනය | |
| 46 | | | 2197/22 | 69936333 | කාන්තා පා පැදිය | |
| 47 | | | 131/23 | 69927743 | පා පැදිය | |
| 48 | | | 155/23 | S.N M 100890815 | ලූකස් බැටරිය | |
| 49 | | | 366/23 | S.N G4J 739487 IMX | වතුර පොම්පය | |
| 50 | | | 388/23 | ඉමී අංක 353120117925643 | නොකියා TA 1203 වර්ගයේ ජංගම දුරකතනය | |
| 51 | | | 648/23 | 57178500 | කාන්තා පාපැදිය | |
| 52 | | | 739/23 | M 2101 K 6 G | Redmi වර්ගයේ ස්මාර්ට් ජංගම දුරකතනය | |

| අංකය | නඩු අංකය | | | වාහන අංකය | වාහන වර්ගය | වාහනයේ තත්ත්වය |
|---|---|---|---|---|---|---|
| | නඩු අංකය | බී වාර්තාව | ඒ වාර්තාව | | | |
| 53 | | | 838/23 | - | උපාංග | |
| 54 | | | 839/23 | 169632/11 | කාන්තා පාපැදිය | |
| 55 | | | 859/23 | ඉමි අංක 861171036843396 | ස්මාර්ට් ජංගම දුරකතනය | |
| 56 | | | 1211/23 | ඉමි අංක 867542020754241 | ස්මාර්ට් ජංගම දුරකතනය SCC 421 | |
| 57 | | | 1212/23 | S.N 32 DM 110021020 | Maximo වර්ගයේ රූපවාහිනිය | |
| 58 | 53213 | 15/22 | | | පොල් | |
| 59 | Conculeded Cases | | | | සවල් - 100 | |
| 61 | Conculeded Cases | | | | උදළු 12 | |

07 - 377

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පන්නල**

2025 වර්ෂය සඳහා පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

**2025 ජනවාරි මස 01 දින සිට 2025 දෙසැම්බර් මස 31 දක්වා** වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා, 1982 අගෝස්තු මස 20 වැනි දින නිකුත් කරන ලද, අංක 207 දරන *ගැසට් පත්‍රයේ* සුරාබදු කොමසාරිස්වරයා විසින් පළකරන ලද, රා විකිණීමේ කොන්දේසිවලට ද, යටත්ව **2024 අගෝස්තු මස 27 වැනි දින පෙ. ව. 10.30** දක්වා පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිල දී ගැනීමට ඉදිරිපත් වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කර, මෙහි පහත දැක්වෙන ටෙන්ඩර් උපලේඛනයෙන් නියම කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප් ශාඛාවකට ගෙවා ලබාගත් කුවිතාන්සියක් ද, ඉහත දක්වා ඇති *ගැසට් නිවේදනයේ* වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි, ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව කවරයක බහා, එයට මුද්‍රා තබා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නම ද, පැහැදිලිව ලියා, උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැකි ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන **2024.08.27** වැනි දින **පෙ. ව. 10.30** ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි පෙනී සිටිය යුතු ය.

05. කිසිම කරුණු දැන්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර්පත්‍ර සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, සාර්ථක ටෙන්ඩර්කරුවකු විසින් එසේ ප්‍රකාශ කළ දින **ප. ව. 2.00** ට පෙර පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. 2025 වර්ෂය සඳහා මෙතෙක් රා තැබෑරුම පැවති ස්ථානය ලබා දීමට සහතික විය නොහැක. එම ගොඩනැගිල්ල නොලැබෙන්නේ නම්, ඒ වෙනුවට තෝරා ගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබාගත යුතු ය.

08. **2024.08.27** දින රේන්ද විකිණීමේ දී සතුටුදායක ඉල්ලීම් නොලැබුනහොත් **2024.09.24** වැනි දින **පෙ. ව. 10.30** ට නැවත රේන්ද විකිණීම මෙම කාර්යාලයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

10. මෙම නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

ආර්. එම්. එස්. වික්‍රමරත්න බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
පන්නල.

2024 ජුනි මස 26 වැනි දින,
පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

**පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත රා තැබෑරුම - 2025 වර්ෂය**

| *අංකය හා නම* | *පත්තුව* | *තැබෑරුම විවෘත කළ යුතු ප්‍රදේශය* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් වසන දිනය හා වේලාව* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* |
|---|---|---|---|---|---|
| අංක 01 ගිරිඋල්ල | කටුගම්පල හත්පත්තුව | මාහරගම/හාල්පනේගම (අංක 1566 මාහරගම වසම තුළ) | 3,500 | 2024.08.27 පෙ. ව. 10.30 | පෙ. ව. 10.00 ප.ව. 9.00 |

07 - 362

## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බදුල්ල

2025 වර්ෂය සඳහා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

**2025 ජනවාරි මස 01 වැනි දින සිට 2025 දෙසැම්බර් මස 31 වැනි දින** දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව, **2024.08.16 වැනි දින පෙරවරු 10.30** දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ආපසු ගෙවන රු. 5,000.00 ක් ගෙවා ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර හෝ පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියමකර ඇති මුදල් ගෙවා ලබාගත් ටෙන්ඩර් වටිනාකමින් 25% ක් ඉක්මවන වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමෙහි අංකය හා නම පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් භාර ගනු නොලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන **2024.08.16 වැනි දින පෙරවරු 10.30** ට සියලු ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බදුල්ල ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් රේන්ද නැවත විකිණීම **2024.09.13 වැනි දින පෙ. ව. 10.30** ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින **පස්වරු 2.00** ට පෙර බදුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැන ගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි වේ.

තුෂාරි අනුරාධා නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2024 ජුනි මස 05 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

2025 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම පිළිබඳ විස්තර - බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
2025.01.01 වැනි දින සිට 2025.12.31 වැනි දින දක්වා

| තැබෑරුමේ නම සහ අංකය | කොට්ඨාසය | තැබෑරුම පිහිටුවන ප්‍රා.ලේ. කොට්ඨාසය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|---|
| බදුල්ල අංක 01 රා තැබෑරුම | බදුල්ල | බදුල්ල මහ නගර සභා අංක 06 දරන කොට්ඨාසයේ හුණුකොටුව නමැති රජයේ ඉඩම | පෙ.ව. 10.00 | ප.ව. 9.00 | රු. 5,000.00 | 2024.08.16 පෙ.ව.10.30 **නැවත විකුණන දිනය.-** සාර්ථක ගැණුම්කරුවෙකු ඉදිරිපත් නොවුවහොත් **2024.09.13 වැනි දින පෙ. ව. 10.30** ට නැවත විකිණීම සිදු කෙරේ. |

07 - 366

---

# රජයේ නොවන දැන්වීම්

**නිර්මායා වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**
**[කලින් නිර්මායා හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්]**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය යටතේ නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 සමාගම් පනතේ වගන්ති 8 හි විධිවිධානවලට අනුව "නිර්මායා හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" විසින් එකී නාමය 2024 ජුනි 07 වැනි දින "නිර්මායා වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" (අළුත් නම) යනුවෙන් වෙනස් කර (සමාගමේ ලියාපදිංචි අංකය PV 116106) එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 00300, ඕල් පෙදෙස, අංක 02, කන්දයියා නීලකන්දන් ගොඩනැගිල්ල, (4 වන මහල) හි ලිපිනයේ පිහිටුවාගෙන ඇති බව අපි මෙයින් මහජනයා වෙත දැනුම් දෙමු.

සෂිදේවී නීලකන්දන්,
අධ්‍යක්ෂ.

එන් ඇන්ඩ් එන් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගම් ලේකම්වරු),
කන්දයියා නීලකන්දන් ගොඩනැගිල්ල (4 වන මහළ),
අංක 02, ඕල් පෙදෙස,
කොළඹ 00300.

07 - 373

---

**ටෙම්පෙස්ට් පී. ඊ. පාර්ට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

ප්‍රකාශිත ප්‍රාග්ධනය අවකරණය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 59 (2) වගන්තිය ප්‍රකාරව ටෙම්පෙස්ට් පී. ඊ. පාර්ට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි රුපියල් මිලියන එකසිය විස්සක් (රු. 120,000,000/-) වූ ප්‍රාග්ධනය රුපියල් මිලියන පනස් පහ දක්වා අවකරණය (රු. 55,000,000/-) කර ඉතිරි මුදල වන රුපියල් මිලියන හැට පහක් (රු. 65,000,000/-) කොටස් හිමියන් වෙත ආපසු ලබාදෙන බව මෙසේ දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටෙම්පෙස්ට් පී. ඊ. පාර්ට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
එස් එස් පී කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

07 - 384

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.